# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1779/21 – 2012 ඔක්තෝබර් 11 වැනි බ්‍රහස්පතින්දා – 2012.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෝතැල්ල (අ.ග.පි. 1769) ගමේ පිහිටි, කුරුණෑගල කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් සකස් කරන ලද අංක කේයු/එවටීටී/2011/433 සහ 2011.11.03 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති වඳුරුස්ස හේන්යාය, වෙලේහේන, කොස්ගහහේන, මීගහමුලහේන හෙවත් වත්තයාගම වත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්. 0.7282ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අක්ෂර 'ඒ' – වඳුරුස්ස හේන්යාය, වෙලේහේන, කොස්ගහහේන, මීගහමුලහේන හෙවත් වත්තයාගම වත්ත – ප්‍රමාණය: හෙක්. 0.7282ක් පමණ**

උතුරට: කේ. ඒ. ඥාණතිලක හිමිකම් කියන වත්තයාගම වත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ කේ. ඒ. ඥාණතිලක හිමිකම් කියන වත්තයාගම වත්ත; දකුණට සහ බටහිරට: කේ. ඒ. ඥාණතිලක හිමිකම් කියන වත්තයාගම වත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/8/2011/පීසී/183.
ප්‍රා.ලේ. අංකය: 3/2/2/63.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6, 'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
2012 සැප්තැම්බර් මස 12 වැනි දින.

10 – 1092

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාජවන්නි පත්තුව සුළු කොට්ඨාසයේ බලගොල්ලාගම (අ.ග.පි. 3465) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක පු/සජ/2011/186 හා 2011.07.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.0226 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටස් වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'අ' – ප්‍රමාණය: හෙක්. 0.0076**

උතුරට: අ.ග.පි. 3465හි කැබලි අංක 177, 148 සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට සහ දකුණට: අ.ග.පි. 3465හි කැබලි අංක 148 සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: අ.ග.පි. 3465හි කැබලි අංක 177.

02. **කැබලි අක්ෂර 'ආ' – ප්‍රමාණය: හෙක්. 0.0150**

උතුරට: අ.ග.පි. 3465හි කැබලි අංක 177, 148 සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට සහ දකුණට: අ.ග.පි. 3465හි කැබලි අංක 148 සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: අ.ග.පි. 3465හි කැබලි අංක 173 සහ 177.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/7/2011/HW/297.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2012 ජුලි මස 10 වැනි දින.

10 – 1093


1A – G 16736 – 360 (2012/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.